# තනතුරු - ඇබෑර්තු

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

කුලියාපිටිය ප්‍රදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* | *අවශ්‍ය ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා* | *පළපුරුද්ද* |
|---|---|---|---|---|---|---|
| 1 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු (ප්‍රාථමික ශිල්පීය නොවන) | 01 | රු. 24,250 250 x 10-270x10-300x10-330 x 12-රු. 36,410 PL - 1-2016 (2020.01.01 දින දක්වා ගෙවීම් සිදුකරන්නේ රා.ප.ච.3/2016 හි උපලේඛන අංක ii සඳහන් පරිදිය) | රජය විසින් අනුමත කරන ලද පාසලක 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. | - | - |
| 2 | පුස්තකාල සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන) | 01 | රු. 24,250 250 x 10-270 x 10-300 x 10-330 x 12-රු. 36,410 PL-1-2016 (2020.01.01 දින දක්වා ගෙවීම් සිදුකරන්නේ රා.ප.ච. 3/2016 හි උපලේඛන අංක ii සඳහන් පරිදිය) | අ.පො.ස (සා.පෙළ) විභාගයේ විෂයයන් දෙකක් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | - | - |

01. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ කළ යුතුය.)

(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බලනොපැවැත්වේ.)

(iv) දණ්ඩ නීති සංග්‍රහයේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(v) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගිවන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

(ii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.

(iv) මෙම බඳවාගැනීමේ කොන්දේසිවලට අමතරව ගරු වයඹ ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 දින අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද මුදල් රෙගුලාසිවලටද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතුයි.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(I) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2019.10.31 දින හෝ එදිනට පෙර ලේකම්, කුලියාපිටිය ප්‍රාදේශීය සභාව, බෝහිංගමුව, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(II) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ............................ තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර අයදුම්පත් එවිය යුතුය.

(III) අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

* උප්පැන්න සහතිකය,
* අධ්‍යාපන සහතිකය,
* අස්වීමේ සහතිකය,
* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය, (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
* මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්,
* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය මා සතුය.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2019ක් වූ සැප්තැම්බර් මස 16 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

***කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම - 2019***

......................................... *තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————————
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————
3. ස්ථිර ලිපිනය :——————————————
4. දුරකතන අංකය :——————————————
5. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :——————————————
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————
7. දිස්ත්‍රික්කය :——————————————
8. උපන් දිනය: වර්ෂය:——————, මාසය :——————, දිනය:——————
9. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:——————, මාස:——————, දින:——————

10. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————

11. ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන්ද යන වග :——————————————

12. විවාහක/අවිවාහක යන වග:——————————————

13. ජාතික හැඳුනුම්පත් අංකය:——————————————

14. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා/පෙළ) විභාගය :——————————

සමත් වර්ෂය හා විභාග අංකය :——————————

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

15. වෘත්තීය වෙනත් සුදුසුකම් :——————————

16. සේවා පළපුරුද්ද :——————————

(i) දැනට සේවය කරන ආයතනය :——————————

(ii) දැනට දරන තනතුර :——————————

(iii) එම තනතුරට පත් වූ දිනය :——————————

(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව දනිමි.

——————————

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .....................................මයා/මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ ........................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

——————————

ආයතන ප්‍රධානියාගේ හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම :——————————

පදවි නාමය :——————————

ආයතනය :——————————

දිනය:——————————

10-665